**නිවිතිගල ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නිවිතිගල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පත් පොළී රු.71,342ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | දොළොස්වල කොම්පෝස්ට් අංගනයේ රු.467,580ක් වූ විදුලි සැපයුම් පිරිවැය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | ස්ථාවර වත්කම් පරිත්‍යාග රු.1,036,938ක් මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ කඩකාමර කුලී බිල්කිරීම් රු.1,008,000ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.18,448,710ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | - එම - |
| (ඊ) | 2021 වර්ෂයේ ලද නඩු තීන්දුවක් නිසා වසර 25ක් වැඩ තහනම් කළ සේවකයෙකු වෙත ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.56,737,900ක් වූ ගිණුම් විෂයයන් 02ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතුව රු.321,938ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු, මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,713,191ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,227,262ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,574,429 | 2,698,119 | 2,645,318 | 1,285,333 | 2,625,910 | 2,635,747 | 2,682,083 | 1,404,190 |
| කුලී | 13,053,700 | 7,688,250 | 7,517,814 | 147,990 | 12,469,600 | 5,826,000 | 4,860,668 | 826,700 |
| බලපත්‍ර ගාස්තු | 1,163,590 | 1,026,705 | 1,026,705 | 1,500 | 1,252,540 | 1,096,267 | 1,096,267 | 1,500 |
| වෙනත් ආදායම් | 2,507,250 | 3,164,210 | 3,163,442 | - | 2,314,300 | 3,278,566 | - | - |
| | 19,298,969 | 14,577,284 | 14,353,279 | 1,434,823 | 18,662,350 | 12,836,580 | 8,639,018 | 2,232,390 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,092,853ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05කට වඩා පැරණි රු.469,203ක ශේෂ පැවැතිණි. | පැවති ආර්ථික අර්බුද හමුවේ මුල් කාර්තුවේ දී දේපළ තහනම් සිදු නොකළ ද අවසන් කාර්තුවේ දී රු.112,102 ක ආදායමක් දේපළ තහනම් කිරීම මගින් අයකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.115,815ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.70,495ක ශේෂ පැවැතිණි. | කඩිනමින් අක්කර බදු සත්‍යායේක්ෂණයක් සිදුකොට අක්කර බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුවේ. |
| (ඇ) | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂය තුළ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2023 වර්ෂයේ දී පරිසර බලපත්‍ර ලබා දිය යුතු ව්‍යාපාරික ස්ථාන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණය සිදුකොට ඇති බව. | වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කර හිඟ ආදායම් අයකර ගත යුතුවේ. |
| (ඈ) | ගාස්තු නොගෙවන දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ව්‍යාපාර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වසරේදී දුරකතන කුළුණු හිමි ආයතන නිශ්චිතව හඳුනාගෙන ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | සභාවට ලැබිය යුතු ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ.. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොම්පෝස්ට් අංගනයක් වෙනුවෙන් 2019 වර්ෂයේ සිට රු.9,329,705ක් වැයකර තිබුණි. එමෙන්ම, 2022 අගෝස්තු 08 දින පළාත් සභාවෙන් රු.950,000ක් වූ බෙලර් යන්ත්‍රයක් ද ලැබී තිබුණි. එහෙත් විදුලිය නොමැතිවීමෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් මේ වනවිට පොහොර හැලීම සිදුකරන අතර, පොහොර කිලෝග්‍රෑම් 1500 ක් පමණ හලා පැකට් කර ඇති බව හා එම කටයුතු දෛනිකව සිදුකරනු ලබන බව. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ප්‍රධාන කාර්යාල භූමිය හා උපකාර්යාල භූමිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | නිකුත් කළ කොඩිකණු 96ක් ආපසු භාර දී නොතිබුණි. ඉන් කණු 15ක වටිනාකම අයකර ගෙන තිබුණද, රු.1,032,750ක් වූ කොඩිකණු 81ක වටිනාකම, මහා සභා තීරණය පරිදි වගකිව යුතු අයගෙන් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, භාණ්ඩ 35ක ඌනතාවට වගකිව යුතු අය නිශ්චය කර නොතිබුණි. | කොඩි කණු 51ක් ගෙන්වා ගැනීමට නිවේදන නිකුත් කර ඇත. ඉතිරි කණු 30 ගෙන්වා ගැනීමට හෝ ඊට අලාභය අය කිරීමට හෝ කටයුතු කරන බව හා භාණ්ඩ ඌනතා සඳහා වගකිව යුතු අයගේ 2023 අප්‍රේල් මස වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බව. | මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගත යුතු වේ. |

## 3.4 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු නොවූ වාහන 04ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම්ගේ උපදෙස් අනුව පවරා ගැනීමට අදාළ ලේඛන ඉදිරිපත් කර ඇති බව. | 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගලි යැපුම් දීමනාවක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ දී සභාව වෙත ලද රු.88,600ක් විධිමත් අනුමැතියක් රහිතව කිහිපදෙනෙකු වෙත දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | ප්‍රාදේශිය සභා පනතේ 9.3 වගන්තිය අනුව ලේකම් විසින් තීරණය කර එම දීමනාව 2017 වර්ෂයේ සිට ලබාගෙන ඇති බව. | දිරි දීමනා ගෙවීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබාගත යුතු වේ. |